# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1985 අංක 48 දරන
# ආනයන සහ අපනයන (පාලන) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1985 දෙසැම්බර් මස 27 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1985 දෙසැම්බර් මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

## 1985 අංක 48 දරන ආනයන සහ අපනයන (පාලන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1985 දෙසැම්බර් මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 58/84

**1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1985 අංක 48 දරන ආනයන සහ අපනයන (පාලන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනතේ 11 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්ති මෙයින් ඇතුලත් කරනු ලබන අතර ඒ වගන්ති ඒ පනතේ 11අ, 11ආ, 11ඇ සහ 11ඈ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය:— — 1969 අංක 1 දරන පනතේ 11අ, 11ආ, 11ඇ සහ 11ඈ අලුත් වගන්ති ඇතුලත් කිරීම.

"ගෙවීම පැහැර හැර ඇති තැනැත්තන්ගේ නාම ලේඛනයක් පළ කිරීම.

11අ. (අ) ශ්‍රී ලංකාවේ සිට ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු වෙත අපනයන කරනු ලැබූ යම් භාණ්ඩයක් සඳහා හෝ,

(ආ) විකිණීමට එකඟවීමකට අනුකූලව ශ්‍රී ලංකාවේ සිට එවැනි යම් තැනැත්තකුට අපනයනය කිරීමට ඇති යම් භාණ්ඩ සඳහා හෝ

ගෙවීම පැහැර හැරීමක් කර ඇති බවට පාලකවරයා සෑහීමට පත්වන අවස්ථාවක, පාලකවරයා විසින් ජාතික ආර්ථිකයේ හිත පිණිස (මෙහි මින් මතු "ගෙවීම පැහැර හැර ඇති තැනැත්තා" යනුවෙන් සඳහන් කරනු ලබන) එම තැනැත්තාගේ නාම ද, එම ගෙවීම පැහැර හැර ඇති තැනැත්තාගේ ලිපිනය ද එම ගෙවීම පැහැර හැර ඇති තැනැත්තාගේ අනන්‍යතාව දැනගැනීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් විස්තර ද සඳහන් කෙරෙන (මෙහි මින් මතු "ගෙවීම පැහැර හැර ඇති තැනැත්තන්ගේ නාම ලේඛනය" යනුවෙන් සඳහන් කරනු ලබන) නාම ලේඛනයක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

2—ඒ 033153—6,750 (85/09)

ගෙවීම පැහැර හැර ඇති තැනැත්තන්ගේ නාම ලේඛනයේ සඳහන් කෙරෙන ගෙවීම පැහැර හැර ඇති තැනැත්තකුට භාණ්ඩ අපනයනය කිරීම තහනම් කිරීම.

11ආ. තත් කාලයේ ගෙවීම පැහැර හැර ඇති තැනැත්තන්ගේ නාම ලේඛනයේ සඳහන් කෙරෙන ගෙවීම් පැහැර හැර ඇති යම් තැනැත්තකුට කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් භාණ්ඩ අපනයනය කිරීම නොකළ යුතු ය.

ගෙවීම පැහැර හැර ඇති තැනැත්තන්ට අපනයනය කිරීම තහනම් කිරීම බලපත්‍රයේ කොන්දේසියක් විය යුතු බව.

11ඇ. ගෙවීම පැහැර හැර ඇති තැනැත්තන්ගේ නාම ලේඛනයේ සඳහන් කෙරෙන ගෙවීම පැහැර හැර ඇති යම් තැනැත්තකුට බලපත්‍ර දරන්නකු විසින් කිසිම භාණ්ඩයක් අපනයනය නොකළ යුතු ය යන්න සෑම බලපත්‍රයක ම ඇතුළත් කොන්දේසියක් ලෙස සලකනු ලැබිය යුතු ය.

ගෙවීම පැහැර හරිනු ලැබූ මුදල ගෙවනු ලැබීමේ දී ගෙවීම පැහැර හරිනු ලැබූ තැනැත්තන්ගේ නම ඉවත් කිරීම.

11ඇ. ගෙවීම පැහැර හැර ඇති තැනැත්තන්ගේ නාම ලේඛනයෙහි යම් තැනැත්තකුගේ නම පළ කිරීමෙන් පසු ඒ තැනැත්තා විසින් ගෙවීම පැහැර හැර ඇති මුදල ගෙවා ඇති බවට පාලකවරයා සෑහීමට පත්වන අවස්ථාවක, පාලකවරයා විසින් එම තැනැත්තාගේ නම එම නාම ලේඛනයෙන් ඉවත් කළ යුතු ය.”.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 යි. (විදේශීය) රු. 200 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන ඒ ඒ වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.